# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## ලංසු කැඳවීමයි

## ප්‍රසම්පාදන අංක: AHEAD/RA2/ELTAELSE/PDN/FOA/WORKs/10

**සුහුරු පන්ති කාමර 8 ක් සඳහා (SA 2.3 - අදියර I ) සහ ඉංග්‍රීසි භාෂා සම්පත් ඒකකය (SA 5.1) සඳහා අන්තර්ජාල පහසුකම් ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **AHEAD Project** ආධාර යටතේ **අන්තර්ජාල පහසුකම් ස්ථාපනය කිරීම සඳහා** පිළිගත් සුදුසුකම් සහිත සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවනු ලැබේ.

1. මේ පිළිබඳ උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්හට **2023.01.09** දින සිට **2023.01.30** දින දක්වා ලංසු පත්‍රිකා නිකුත් කරනු ලැබේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලංකා බැංකු ශාඛාවට (A/C No: 1273309) ගෙවා, ලබාගන්නා ලද නැවත නොගෙවනු ලබන රු.7500.00 ක ලංසු ගාස්තුවක් ඉදිරිපත් කොට කාර්යාල දිනයන්හිදී පෙ.ව.09.00 සිට ප.ව.03.00 දක්වා පේරාදෙණිය විශ්විද්‍යාලයේ "OTS AHEAD ව්‍යාපෘති" කාර්යාලයෙන් ලංසු පත්‍රිකා ලබා ගත හැක. එසේ ම **www.pdn.ac.lk** යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ද ලංසු අයදුම්පත් බාගත කල හැකි අතර, බාගත කරන ලද ලංසු පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී ඒ සමඟ "මූල්‍යාධිකාරි, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය" යන නමින් නිකුත් කරන ලද **රු.7500.00** ක වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් අමුණා එවීම අනිවාර්ය වේ.

2. නිසිලෙස සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා පිටපතක් ද සමඟ ඒවා බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"Supply and Install necessary internet for 8 smart classrooms and the ELRC" Project No: AHEAD/RA2/ELTAELSE/PDN/FOA/WORKs/10"** ලෙස පැහැදිලිව සඳහන් කර **2023.01.30** දින **ප.ව.01.00** ට හෝ ඊට පෙර නියෝජ්‍ය අධ්‍යක්ෂක ප්‍රසම්පාදන, "OTS AHEAD ව්‍යාපෘති" කාර්යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම විශ්වවිද්‍යාලයේ "OTS AHEAD ව්‍යාපෘති" කාර්යාලයේ තබා ඇති ලංසු බහාලුමේ පුද්ගලිකව තැන්පත් කිරීම කළයුතු වේ. ලංසු පත්‍රිකා **එදිනම ප.ව.01.30** ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන මන්දිරයේ, "OTS AHEAD Project" කාර්යාලයේ දී විවෘත කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔහුගේ නියෝජිතවරයෙකුට ලංසු පත්‍රිකා විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැක.

3. සියලුම ලංසුපත් **රු.189,315.00** ක වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් සමඟ ඉදිරිපත් කළ යුතුය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් ලබාගත යුතු මෙම ලංසු ඇපකරය **2023.05.30** දින දක්වා වලංගු වියයුතු වේ. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් පමණක් ලබාගත් ලංසු ඇපකරයක් විය යුතු **ය. රක්ෂණ සමාගම් මඟින් ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.**

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන් හට, වැඩිදුර තොරතුරු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ OTS, AHEAD Project කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක, ප්‍රසම්පාදන වෙතින් දුරකථන අංක 081-2392326 මඟින් ලබාගත හැක.



**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**පේරාදෙණිය විශ්ව විද්‍යාලය**